දුරකථන /தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832 Fax: 2784825

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50 Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.

'இசுருபாயா'
பத்தரமுல்ல.

"Isurupaya"
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. } ........චක්‍රලේඛ අංක : 2006/49

මගේ අංකය / எமது இல. / My No. } ..ඊඩී/1/9/1/1/04(1)...

දිනය / திகதி / Date } ........2006.12.22.........

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම පාසල් ප්‍රධානීන්(ප්‍රාථමික පන්ති පැවැත්වෙන පාසල්වල) වෙත.

## ප්‍රාථමික අධ්‍යාපනයේ පළමු ප්‍රධාන අවධිය (1 හා 2 ශ්‍රේණි) සඳහා නව විෂයමාලාව ක්‍රියාත්මක කිරීම

1998 වර්ෂයේ සිට හඳුන්වා දුන් ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාව ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක විෂයමාලා ප්‍රතිපත්තියට අනුව නැවත වරක් ප්‍රතිසංස්කරණය කළයුතු අවධියට එළඹ ඇත. එහි පළමු පියවර වශයෙන් 2007 වසරේ සිට ප්‍රාථමික අධ්‍යාපනයේ පළමුවන ප්‍රධාන අවධිය (1 හා 2 ශ්‍රේණි ) සඳහා ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමට තීරණය කර ඇත.

02. ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ක්‍රියාත්මක වන චක්‍රලේඛ අංක 1998/44 හා 1998.11.23 දිනැති සහ චක්‍රලේඛ අංක 2000/02 හා 1999.12.15 දිනැති චක්‍රලේඛයන්ට අමතර වශයෙන් මෙම චක්‍රලේඛය 2007 වසරේ ජනවාරි පළමු වන දින සිට ක්‍රියාත්මක කෙරේ.

03. මේ අනුව 1998 වර්ෂයේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ හඳුන්වා දී ඇති පළමු වන හා දෙ වන ශ්‍රේණි සඳහා වන ප්‍රාථමික අධ්‍යාපන වැඩසටහන්වලට පහත දැක්වෙන අංග අලුතෙන් ඇතුළත් කර ඇත.

i. දෙ වන ජාතික භාෂාවක් ලෙස සිංහල සිසුන් දෙමළ භාෂාවත් දෙමළ සිසුන් සිංහල භාෂාවත් ඉගෙනීම.

ii. දිනපතා මිනිත්තු 15ක් ලෙසට ක්‍රියාත්මක වූ ශරීර සුවතා වැඩසටහන දිනකට මිනිත්තු 20ක් ලෙස ක්‍රියාත්මක කිරීම.

iii. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයය සමග ක්‍රියාත්මක වූ ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි වැඩසටහන ගණිතය විෂය සමග ද ක්‍රියාත්මක කිරීම.

iv. දිවා ආහාර ලබා දීමේ වැඩසටහන සඳහා කාලය වෙන් කිරීම.

v. පළමු වන හා දෙ වන ශ්‍රේණි සඳහා වන පොදු ගුරු අත්පොත් දෙක වෙනුවට සංස්කරණය කරන ලද ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ දෙකක් හඳුන්වා දීම.

vi. ශරීර සුවතා ක්‍රියාකාරකම්, දිවා ආහාරය, දෙ වන ජාතික භාෂාව යන වැඩසටහන් සඳහා කාලය ලබා ගත යුතු බැවින් දැනට දිනකට පැය 04ක් වන කාලය පැය 04 මිනිත්තු 15ක් ලෙස දීර්ඝ කිරීම.

04. ඒ අනුව එක් එක් විෂයයන් සඳහා සතියකට නියමිත කාලය පහත දැක්වෙන පරිදි විය යුතු ය.

| විෂයය | සතියකට කාලය |
|---|---|
| 01. මව්බස | පැය 05 |
| 02. ගණිතය | පැය 03 මිනිත්තු 30 |
| 03. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් | පැය 05 මිනිත්තු30 |
| 04. ආගම | පැය 01මිනිත්තු 15 |
| 05. දෙ වන ජාතික භාෂාව | මිනිත්තු 30 |
| 06. උදය රැස්වීම් හා ආගමික වතාවත් | පැය 01 මිනිත්තු 15 (දිනකට මිනිත්තු 15 බැගින්) |
| 07. විවේක කාලය | පැය 01 මිනිත්තු 15 (දිනකට මිනිත්තු 15 බැගින්) |
| 08. ආහාර ගැනීම සඳහා | මිනිත්තු 50 ( දිනකට මිනිත්තු 10 බැගින්) |
| 09.ශරීර සුවතා ක්‍රියාකාරකම් | පැය 01 මිනිත්තු 40 (දිනකට මිනිත්තු 20 බැගින්) |
| 10 විෂය සමගාමී ක්‍රියාකාරකම් | මිනිත්තු 30(සතියේ එක් දිනක) |
| සතියකට මුළු කාලය | පැය 21 මිනිත්තු 15 |

05. ඉහත සටහනෙහි දිනකට නියමිත කාලය දක්වා ඇති අවස්ථා හැර අනෙක් සෑම විට ම කාලච්ඡේදයක් මිනිත්තු 30ක් ලෙස සලකා කාලය බෙදා ගත යුතු ය. එක ම ගුරුවරයකු සියලුම විෂයයන් උගන්වන බැවින් නම්‍ය ලෙස මෙම කාලය යොදා ගැනීමට ගුරුවරයාට නිදහස ඇත. එහෙත් ඒ ඒ විෂයයන් සඳහා නියමිත කාලය ලබා ගැනීම පිළිබඳ ව සැලකිලිමත් විය යුතු ය.

06. මේ අනුව පළමු වන හා දෙ වන ශ්‍රේණිවල දිනකට වැඩකරන කාලය පැය 04 මිනිත්තු 15කි. එනම් පෙරවරු 07.30 සිට පෙරවරු 11.45 දක්වා වේ.

07. මෙතෙක් භාවිත කළ පෙළපොත්වල කිසිදු වෙනසක් සිදු නො වේ.

08. පළමු වන ශ්‍රේණිය භාර ගුරුවරයා අනුගාමී වසරේ දී දෙ වන ශ්‍රේණිය භාර ව කටයුතු කිරීමට සැලසුම් කළ යුතුයි.

09. මෙයට අමතර ව 1998 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සමග හඳුන්වා දී ඇති ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ සියලු වැඩසටහන් ඉදිරියට ද ක්‍රියාත්මක කෙරේ.

10 දෙ වන ප්‍රධාන අවධිය (3 හා 4 ශ්‍රේණි) සහ තුන් වන ප්‍රධාන අවධිය (5 ශ්‍රේණිය) සඳහා දැනට ක්‍රියාත්මක වන ශරීර සුවතා වැඩසටහන සඳහා වෙන් කර ඇති කාලය මිනිත්තු 15කි. එහෙත් 2007 වසරේ සිට මෙම වැඩසටහන සඳහා මෙම අවධිවලට මිනිත්තු 25ක කාලයක් යොදා ගත යුතු ය. මෙම වැඩිපුර එක්වන මිනිත්තු 10ක කාලය මෙම අවධි සඳහා වෙන්කර ඇති මිනිත්තු 30ක් වූ විවේක කාලයෙන් ලබා ගත යුතු වේ. ඒ අනුව මෙම අවධි සඳහා ශරීර සුවතා ක්‍රියාකාරකම් සඳහා කාලය මිනිත්තු 25ක් හා විවේක කාලය මිනිත්තු 20ක් ලෙසට සංශෝධනය කෙරේ.

ආර්යරත්න හේවගේ,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.